# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1793/24 – 2013 ජනවාරි 18 වැනි සිකුරාදා – 2013.01.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කිරිමැටියාව සුළු කොට්ඨාසයේ, තම්මැන්නාවැටිය ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක අ.ග.පි. 3216 පිඹුරේ අතිරේක අංක 20 සැලැස්මේ කැබලි අංක 1144 වශයෙන් දැක්වෙන 'ගොඩකැලේ' නමැති ඉඩමෙන් මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.0765 ක් පමණ වන පහත ඉඩම් කොටස:

01. **කැබලි අංක 1144 (කැබලි අංක 758න් කොටසක්)**

ඉඩමේ නම: ගොඩකැලේ; විස්තරය: –; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: බී. උක්කුවා, වෙලේවැව, නවගත්තේගම; ප්‍රමාණය: හෙක්. 0.0765.

ඉහත සඳහන් ඉඩම් කොටසට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2013 මාර්තු මස 06 වැනි දින පූ. හා. 11.00 ට නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2013 පෙබරවාරි මස 20 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ආර්. පී. ජී. පොඩිනේරිස්,  
ප්‍රාදේශීය ලේකම්,  
නවගත්තේගම.

2012 දෙසැම්බර් මස 08 වැනි දින,  
නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

02 – 179